# නාගොඩ ප්‍රාදේශිය සභාව
## ගාල්ල දිස්ත්‍රික්කය

## 01. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 නොවැම්බර් 09 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2013 පෙබරවාරි 13 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදි.

### 1.2 මතය

මාගේ පරීක්ෂණයේ පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව නාගොඩ ප්‍රාදෙශීය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම් හැර 2011 දෙසැම්බර් 31 දිනට නාගොඩ ප්‍රාදේශිය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදු පිළිගත් ගිණුම්කරණ මුලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවත් මා දරන්නා වු මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

සභාව විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සමග හෙළිදරව් කර නොතිබුණි.

#### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

##### (අ) පිළිතුරු නොලත් විගණන විමසුම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට විගණන විමසුම් 08 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එකී විමසුම්වලට භාජනය වූ ගනුදෙනුවල ගණනය කළහැකි වටිනාකම රු.1,651,590 ක් විය.

##### (ආ) තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ඉඩම් හා ගොඩනැගිලි | 39,546,260 | හිමිකම් ඔප්පු, යාවත්කාලීනව පවත්වා ගෙනයනු ලැබූ ස්ථාවර වත්කම් ලේඛනය සහ උප ලේඛන |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 5,586,236 | යාවත්කාලීනව පවත්වා ගෙනයනු ලැබූ ස්ථාවර වත්කම් ලේඛනය සහ උපලේඛන |
| මෝටර් රථ හා කරත්ත | 4,775,868 | |
| ලී බඩු හා සවිකිරීම් | 1,443,416 | |
| ණයගැතියෝ | 27,242,124 | යාවත්කාලීන කරන ලද ණයගැති ලේඛනය ණයහිමි ලේඛනය හා කාල විශ්ලේෂණය |
| ණයහිමියෝ | 13,947,598 | |

## 02. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,378,161 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.256,449 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000' | රු.000' | රු.000' |
| (i) | වරිපනම් හා බදු | 114 | 71 | 212 |
| (ii) | බදු කුලී | 2,178 | 2,528 | - |
| (iii) | බලපත්‍ර ගාස්තු | 470 | 620 | - |
| (iv) | වෙනත් ආදායම් | 20,977 | 17,132 | 27,030 |

#### 2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 519,083 |
| (ii) | මුද්දර ගාස්තු | 3,756,201 |

#### 2.2.3 හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවල පාදේශීය සභාවට අයකර ගත යුතුව තිබූ අක්කර බදු රු.211,788 ක් සහ වෙනත් ආදායම් රු.27,030,336 ක් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 සහ 159 වගන්ති පකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.4 දුරකථන / විදුලි සංදේශන කුළුණු ගාස්තු**

---------------------------------------------

රජයේ ඉඩම් දීර්ඝකාලීන බද්ද යටතේ ලබාගෙන ආයතන 04 ක් විසින් ඉදිකර ඇති විදුලි සංදේශ කුළුණුවලින් රු.236,000 ක ගාස්තු අයකර ගතයුතුව තිබුණි.

**2.3 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්**

-------------------------------------------------

සභාව සතු රු.3,900,000 ක් වටිනාකම වූ ජේ.සී.බී. යන්ත්‍රය 2011 මාර්තු 18 දින සිට විගණන දිනය වූ 2012 දෙසැම්බර් 05 දින දක්වා වූ මාස 20 ½ ක කාලපරිච්ඡේදයක් තුල නිශ්කයව පැවති බව නිරීක්ෂණය විය. එමෙන්ම යන්තය අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට ද කටයුතු කර නොතිබුණි.

**2.4 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

----------------------------------------------------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132(ඒ) වගන්තිය අනුව පොදු වැදගත්කමකින් යුත් කාර්යයන් පිළිබඳ උත්සව වියදම් සම්බන්ධයෙන් එක් වර්ෂයකට මුළු එකතුව රුපියල් එක්දහසක් නොඉක්මවන පරිදි වියයුතු අතර, එය ඉක්මවන විට ඒ සඳහා අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලියවිල්ලකින් ලබා ගතයුතු වුවත්, අමාත්‍යවරයාගේ අනුමැතිය නොලබා 2011 වර්ෂයේ දී උත්සව වියදම් වශයෙන් රු.79,678 ක මුදලක් වැයකර තිබුණි.

**2.5 කොන්ත්‍රාත් පරිපාලනය**

-------------------------

උඩුගම සමගිගම ගම් වාසීන්ට පවතින පානීය ජල හිඟයට විසඳුමක් ලෙස උඩුගම දකුණ ජල යෝජනා ක්‍රමය අදියර 4 ක් යටතේ 2003 වර්ෂයේ සිට 2007 වර්ෂය දක්වා රු.534,979 ක් වැයකර, නිමකර තිබුණ ද, ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර නිවැරදි ස්ථානීය පරීක්ෂාවක් නොකිරීම නිසා ජල මෝටරය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය බලශක්තිය නොමැතිවීම හේතුවෙන් මේ වන විටත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. 2012 මාර්තු 13 කරන ලද ස්ථානීය පරීක්ෂාවේ දී ජල මෝටරය තැබීමට ඉදිකරන ලද කුටියේ දොර දිරාපත් වී ගැලවී තිබූ බවත්, ඒ අවට වල්බිහි වී තිබූ බවත් ටැංකිය ආසන්නයේ එලන ලද නල නොමැති බවත් නිරීක්ෂණය විය.

**2.6 වීථි පහන් සඳහා වූ වියදම් ප්‍රතිපූරණය කර නොගැනීම**

-------------------------------------------------------------

වීථි පහන් උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් 2011 වර්ෂය සඳහා රු.288,239 ක් ද, වීථි පහන් නඩත්තුව සඳහා රු.289,525 ක් මුදලක් වැයකර තිබුණ. වීථි පහන් සවි කිරීම පිළිබඳ උපදෙස් දැක්වෙන වාරිමාර්ග හා විදුලිබල අමාත්‍යාංශයේ අංක: පීඑෆ/12/91 හා 1998 මාර්තු 16 දිනැති චක්‍රලේඛය අනුව වීථි පහන් අළුතින් ස්ථාපිත කිරීමට පෙර විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබා ගතයුතු වුවද, එලෙස අනුමැතිය ලබා නොගෙන වීථි පහන් 48 ක් සවිකර තිබුණි. එමෙන්ම 2011 වර්ෂය හා 2010 වර්ෂය සඳහා ලංකා විදුලිබල මණ්ඩලය සමග ගිවිසුම් අත්සන් කර තිබුණ ද, කිසිදු දීමනාවක් සභාව වෙත ලැබී නොතිබුණි.

**2.7** වාර්ෂික සැලසුම්

--------------------

2003 ජුනි 02 දිනැති අංක: PED/12 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව සංයුක්ත සැලැස්මක් හා වාර්ෂික ක්‍රියාකාර සැලැස්මක් සකස් කර නොතිබුණි. ප්‍රසම්පාදන සැලැස්මකද පිළියෙල කර නොතිබුණි.

## 2.8 අභ්‍යන්තර විගණනය

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබූ අතර විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි.

## 3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) කොන්ත්‍රාත් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය